# අසිරිමත් කුහුඹු ලෝකය



ඩබ්.එම්.හිරන්‍යා යසස්වී වීරසේකර

# අසිරිමත් කුහුඹු ලෝකය

**කතෘ**

**ඩබ්.එම්.හිරන්‍යා යසස්වී විරසේකර**

## කෘතියේ අයිතිය

ඩබ්.එම්.හිරන්‍යා යසස්වී විරසේකර
මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

## කතෘගේ වෙනත් කෘති

පුංචි සඳුනි
කුරුළු පැටික්කී

## කෘතිය පළකරන දිනය

2025 පෙබරවාරි 08

**ISBN NO-978-624-208-178-6**



# පිදුම

මහාමායා විදුමව් තුරුලේ,
මගේ ලොව ගුණ නැනෙන්
එළිය කළ ,
ආදරණීය හඳා අතාවුද
ගුරු මෑණියන්වෙත,

ආදරයෙන් පුදමි.



# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම්පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම විශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී හිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරණ “ **හෙරණගත්කරණී**” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා සාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමාණයක් වන අතරම පසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය-මහනුවර

# පටුන

| | |
|---|---|
| | පිටුව |
| 01.සත්ව ලෝකයේ පුංචි හපනා | 1-3 |
| 02.කුහුඹුවෝ මොනවගේ ද? | 4-5 |
| 03.කුහුඹුවන්ගේ නායකයා කුහුඹු රැජිනයි | 6 |
| 04.කුහුඹුවන්ගේ ආහාර | 7 |
| 05.ශක්තිවන්ත පුංචි කුහුඹුවෝ | 8 |
| 06.අපට ආදර්ශමත් පුංචි කුහුඹුවෝ | 9-12 |



# 01.සත්ව ලෝකයේ පුංචි හපනා.....

පුංචි යාළුවනේ.....

මේ නිවාඩු කාලයේ මම හොයා ගත්තා සත්ව ලෝකයේ පුංචි ම පුංචි හපනුන් වන කුහුඹුවන් ගැන.

ඔයාලා දන්නවාද ....?

කුහුඹුවන් වසර මිලියනයකට වැඩි කාලයක් තිස්සේ මේ මිහිතලය මත ජීවත් වෙනවා. ලොව පුරා කුහුඹුවන් විශේෂ 10,000 වැඩිය සිටිනවා.

ඈත අතීතයේ පොළොවේ ලැග සිටි බඹරුන්ගෙන් කූඹියන්ගේ පරිනාමය සිදු වී ඇති බව විද්‍යාඥයින් විසින් සොයාගෙන තියනවා.

ඇන්ටාක්ටිකාව හා දූපත් කීපයක් හැරුණ විට ලොව සෑම රටකම මේ අපූරු කුහුඹුවන් ජීවත් වෙනවා.

ඒ වගේම නිවර්තන වැසි වනාන්තර ආශ්‍රිතව මොවුන් බහුලව ජීවත් වෙනවා.





මේ පුංචි කුහුඹුවන් බිත්තර වලින් බිහිවෙනවා. හැම කුහුඹුවෙක්ම බිත්තර දමන්නේ නැහැ. බිත්තර දමන්නේ කුහුඹු රැජින පමණයි. අනිත් කුහුඹින් කුහුඹු රැජින දමන බිත්තර පැටවුන් බිහි වෙනතරු ආරක්ෂා කරනවා.





කුහුඹුවන් විශේෂ රතු,කළු හා දුඹුරු පාට වලින් යුක්ත වෙනවා.






තනිව ජීවත් වීමට අකමැති මොවුන් කණ්ඩායම් වශයෙන් කොලණී වල ජීවත් වෙනවා.

කුහුඹුවන්ගේ ආයු කාලය සති කිහිපයක සිට අවුරුදු කිහිපයක් දක්වා වෙනවා.








# 02.කුහුඹුවෝ මොනවගේද?

මේ පුංචි කුහුඹුවන් ආත්‍රප්‍රෝඩා ගණයට අයත් වෙනවා.

කුහුඹුවන්ට ඇට සැකිල්ලක් නැති නිසාත් , සන්දි පාද නිසාත් ආත්‍රප්‍රෝඩා ගණයට අයත් යැයි කියනවා.




කුහුඹුවන් ඉතා කුඩා ජීවීන් නිසා ඔවුන්ට හුස්ම ගැනීමට පෙනහළු පිහිටා නැත.

ඒ වෙනුවට ශරීරයේ ඔක්සිජන් ප්‍රවාහනය කිරීමට ඔවුන්ව ආවේණික ස්වසන ක්‍රමයක් තිබෙනවා.

කුහුඹුවන් ඔවුන්ගේ සිරුරේ පැති වල ඇති සිදුරු මගින් ඔක්සිජන් වාතය ආශ්වාස කරනවා.



ඒ වගේම ,

කුහුඹුවන්ගේ සිරුරේ සෑම සෛලයක්ම ඔක්සිජන් වාතය බෙදා හැරීමට උපකාරී වන නාල තිබෙනවා.



# ඔයාලා දන්නවා ද...?

මේ පුංචි කුහුඹුවන්ට සවන් (කණ්) නැතිබව, කුහුඹුවන් ආහාර ගැනීම සඳහා හෝ අනතුරු ඇඟවීමේ සංඥාවන් හඳුනාගැනීම සඳහා පාද භාවිතා කරනවා.

පාද වල ඇති උප උත්පාදන ඉන්ද්‍රිය පොළොවේඇති කම්පන ඇසීමට භාවිතා කරනවා.







# 03.කුහුඹුවන්ගේ නායකයා කුහුඹු රැජිනයි.

කුහුඹු රැජින කොලණියක් තුල ජීවත් වෙනවා. ඒ වගේම රැජින කොළණියෙන් පිටතට පැමිණෙන්නේ නැහැ.

කුහුඹු රැජින අනෙක් කුහුඹුවන්ව වඩා ශරීරයෙන් විශාලයි. කුහුඹු රැජිනගේ පිටෙහි තටු පිහිටා තිබෙනවා.

ඇය බිත්තර දාන කාලයට තටු ගලවනවා. අපටත් කොළණියක් සදා ගැනීමට අවශ්‍ය නම් කුහුඹු රැජිනක් ඇතිකල යුතු වෙනවා.

ස්වභාවික මරණයක් සිදු නොවුන හොත් රැජිනගේ ආයු කාලය අවුරුදු 30-35ත් අකර වෙනවා.







# 04.කුහුඹුවන්ගේ ආහාර

කුහුඹුවන් සර්ව හක්ෂක සත්ව කාණ්ඩයට අයත් වෙනවා.අපි දන්නේ කුහුඹුවන් පැණි රසට කැමතියි කියලානේ...



ඒ වුණාට කුහුඹුවන් ශාක කොටස්,සත්ව කොටස් ආහාරයට ගන්නවා. යුෂ උරා බොනවා.



කුහුඹුවන් තම ආහාර පිනිස කුඩිත්තන් ඇති කරනවා.මෙම කුඩිත්තන් ස්වභාවික විලෝපිතයන්ගෙන් ආරක්ෂා කර තම ආහාර පිනිස ඇති කරනවා.





# 05.ශක්තිවන්ත පුංචි කුහුඹුවෝ....

මේ පුංචි කුහුඹුවන් ශක්තිවන්ත ය. ඔවුන්ගේ ශරීරයේ බර මෙන් 10-50 අතර ප්‍රමාණයක් දරා ගැනීමේ හැකියාව කුහුඹින්ට තියනවා.



ආසියානු කුහුඹු විශේෂයකට තමාගේ බර මෙන් සිය ගුණයක් එසවිය හැකි බව විද්‍යාඥයින් සොයාගෙන තිබෙනවා.





# 06.අපට ආදර්ශමත් පුංචි කුහුඹුවන්...

**01 කුඹුවන් හැම විටම ලොකු දේවල් කරන්න හිතනවා....**





❖කුහුඹුවන් හැම විටම තම බර මෙන් කිප ගුණයක් උස්සාගෙන යාමට උත්සාහ කරනවා.

➢අපත් එදිනෙදා කාර්යන් සිදු කිරීමේ දී උත්සාහයෙන් කට යුතු කළ යුතු බව මෙහින් ආදර්ශයට ගත හැකිය.

- **කුහුඹුවන් විකල්ප මාර්ග සොයනවා..**
- ගමන් කිරිමේ දි බාදක හමු වූ විට එය මගහැර විකල්ප මාර්ග සොයනවා.





- මෙය අපට ජීවිතයේ පැමිනෙණ භාදක වලට උදාහරණයකි.



**කුහුඹුවන් සැම විටම අනාගතය ගැන සිතා වැඩ කරයි.**

- **කුහුඹුවන් ගිම්හාන කාලයේ වැසි සමයට අවශ්‍ය කෑමරැස් කරයි.**
- අනාගතේ පැමිණිය හැකි බාධක දුෂ්කරතා පිළිබඳ අවබෝධයෙන් ජීවත් වීමට අපට ආදර්ශයක් ගත හැකිය.










- එක නිශ්චිත ඉලක්කයකට සියලුදෙනා එක්ක එකට ගමන් කරයි. පොදුවේ ඉලක්ක ජය ගැනිම සඳහා එකමුතුව කටයුතු කරයි.
- අපත් කුහුඹුවන් මෙන් කණ්ඩායමක එකට කටයුතු කරන ආකාරය මෙහින් ආදර්ශහයට ගත හැතිය.







පුංචි වුනත් ,

මිහිමත වෙසෙන ,

මේ අපූරු කුහුඹුවන්ගෙන් අපට ඉගෙන ගත හැකි ආදර්ශ බොහෝමයි..

මිනිසුන්ට අලුත් විදියට හිතන්න , ලියන්න ,කියන්න හැකියාව තියනවා.

අප තුල විශාල ශක්තියක් තියනවා ...

නැති කාලයට ඉතිරි කරනවා යන්න පමණක් නොව තමන් තුල ඇති උපරිම ශක්තිය ප්‍රයෝජනයට ගැනීමට අපට කුහුඹුවන් ගෙන් ඉගෙන ගත හැකිය.

කුහුඹුවන් මේ මිහිතල වෙසෙන ආකර්ශණීය ජීවින් කොට්ඨාසයකි.

(ඡායාරූප අන්තර් ජාලය ඇසුරිණි)



නිමි.

# පසුවදන



රටේ අනිගත සංවර්ධනයට ඉවහල් වන ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණු සාහිත්‍ය නිර්මානකරණ විභවතා කොටගක් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම හා එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරනයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේනන අංකුර හැටදහසකට වැඩි ප්‍රමානයක් දේශිය සාහිත්‍ය තෙතේ රෝපනය කිරීමට ලැබීම අප ලැබු භාග්‍යයකි.ඒම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසිම සමාජ වගකීමයි. පාසලක් මුලුවිමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙන්වෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධකර ගැනිම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය , දියණියන් , ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක් වු කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැතිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්විමත් සමඟ දරුවන් එහින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටලු නිර්මානය වීමට හේතු වි ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නුතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ , සාහිත්‍ය නිර්මාන හැතියාව තුළින් ඒයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**ISBN NO-978-624-208-178-6**